කෑගල්ල ප්‍රාදේශීය සභාව,
කෑගල්ල දිස්ත්‍රික්කය
.....................................

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 03 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කෑගල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්.
-------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.
-----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 හා ඊට පෙර වර්ෂයන් වෙනුවෙන් පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.193,399 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස සලකා ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. 193,399 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුලින් දක්වා තිබුණි.

(ආ) 2013 වර්ෂයේ අගෝස්තු මස සිට දෙසැම්බර් මස දක්වා කාලයට අදාලව ගෙවිය යුතු රු.20,425 ක මුද්දර ගාස්තු සකස් කිරීමේ දීමනාව සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස සලකා ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. 20,425 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුලින් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉතිරි ද්‍රව්‍ය හා උපකරණ වල වටිනාකම වන රු. 1,768,024 ක් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා වර්ෂයේ අවසාන දිනට තොගයේ වටිනාකම රු. 1,768,024 ක් බැගින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ සභාව සතු පුස්තකාල තුනකට අදාලව පරිත්‍යාග වශයෙන් ලද පොත් 196 ක වටිනාකම වූ රු. 31,696 ක් ප්‍රාග්ධනිත නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් වල වටිනාකම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම්වල ශේෂයන් රු.31,696 ක් බැගින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිම කරන ලද කර්මාන්ත තුනකට අදාල රු.252,072 ක් වූ වියදම් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සිදු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.252,072 ක් වැඩියෙන් හා වර්ෂයේ අවසානයට ණයහිමියන්ගේ වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ අරමුදල් ප්‍රභවයන් 09 ක් යටතේ කර්මාන්ත 975 ක් සිදු කිරීම සඳහා වෙනත් ආයතන තුළින් ලද රු. 148,013,505 ක ප්‍රාග්ධන ආධාර මුදල් හා ඒ තුළින් වැය කරන ලද රු.146,306,954 ක ප්‍රාග්ධන වියදම් මුදල්, තැන්පත් ලැබීම් හා තැන්පත් ගෙවීම් යටතේ ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.1,706,551 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළින් දක්වා තිබුණි.

(උ) මොරදන හා මොරොන්තොට මහජන පුස්තකාල දෙකෙහි පරිග්‍රහන ලේඛන වල ඇතුළත් පොත් 22 ක වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් රු.10,000 අගයකින් යුත් තලේවෙල සුසාන භූමිය රු.1,000 ක් ලෙසට ගිණුම්ගත කිරීම නිසා ස්ථාවර වත්කම් වටිනාකම රු.9,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) සභාවට අයත් රු.625,000 ක් වූ සභාවට අයත් කැබ් රථයේ වටිනාකම සහ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් ලද රු.6,390,000 ක් වූ කැබ්රථයේ වටිනාකම ගිණුම්ගත නොකිරීම නිසා ස්ථාවර වත්කම් අගය රු.7,015,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳුන පාලන ගිණුම

------------------------------

ගිණුමේ දක්වා ඇති රු.9,485,760 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි විෂයයන් 10 ක් ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් නොකිරීම නිසා ගිණුම් වාර්තාවේ උප ලේඛන සමඟ වත්කම් ලේඛනය නොසැසඳී පැවතුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

(අ) 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂවල වටිනාකම රු.21,788,106 ක් වූ අතර එයින් රු.791,582 ක් වසරකට වඩා පැරණි විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.1,506,161 ක් වූ අතර. එයින් රු.398,223 ක් වසරකට වඩා පැරණි විය.

1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.

----------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.571 | 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා අවස්ථා 113 කදී තැන්පත් කරන ලද රු.1,035,809 ක මුදලක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | සබරගමුව පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහය 261.2.2 රීතිය | 2005 වර්ෂයේදී ලබාගත් රු.25,000 ක ගමන් වියදම් අත්තිකාරම් මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයටත් පියවා නොතිබුණි. |
| (ඇ) | සබරගමුව පළාත් පාලන කොමසාරිස්ගේ 2005 ජුනි 01 දිනැති අංක 2005/4 දරන චක්‍ර ලේඛය | |
| | (i) අංක ii හා iii වගන්ති | කට්ටි සැළසුම් අනුමත කිරීමට පෙරාතුව ඉඩම් කට්ටිවල විකුණුම් වටිනාකම පිළිබඳ ලබා ගන්නා ලද තාවකාලික තක්සේරුව පදනම් |

කරගෙන ලබාගත යුතු 1% ක අත්තිකාරම් මුදල ලබා ගෙන නොතිබුණි.

(ii) අංක iv වගන්තිය — ඉඩම් විකුණුම්කරු සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.17,525,581 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.16,077,745 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,447,836 ක වර්ධනයක් දක්නට ලැබුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2014.01.01 දිනට හිගය | 2014.12.31 දිනට හිගයෙන් අයකිරීම | 2014 වර්ෂයේ බිල් කිරීම් | 2014.12.31 දිනට හිගය<br>වර්ෂයේබිල් කිරීම්වලින් අයවීම | 2014.01.01 දිනට පැවති හිගයෙන් | වර්ෂයේ බිල් කිරීම් වලින් හිඟය | මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i වරිපනම් හා බදු | 362,689 | 95,416 | 598,072 | 447,702 | 267,273 | 150,370 | 417,643 |
| ii බදු කුලී | 114,137 | 52,971 | 230,137 | 159,648 | 61,166 | 70,489 | 131,655 |

ඉහත හිඟ ආදායම් වාර්තාව අවසන් ගිණුම සමඟ සැසඳීමේදී පහත වෙනස්කම් නිරීක්ෂණය විය.

| | හිඟ ආදායම් වාර්තාවට අනුව ශේෂය | අවසන් ගිණුම අනුව ශේෂය |
|---|---|---|
| | රු. | රු. |
| වරිපනම් හා බදු | 417,643 | 256,198 |
| හිග හිටි වෙනත් ආදායම් | 131,655 | 21,078,765 |

2.2.2 වෙළඳ බලපත්‍ර ගාස්තු

------------------------

(අ) 2014 වර්ෂයේදී පවත්වාගෙන යමින් තිබූ වෙළඳ ආයතන 13 කින් අයකරගත යුතු රු.7,150 ක බලපත්‍ර ගාස්තුවක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් දෙකකින් ඉකුත් වර්ෂයේ පිරිවැටුම මත 1% ක බදු මුදලක් අයකරගත යුතු වුවද හෝටල් කළමනාකරුවන්ගේ ප්‍රකාශන මත බදු මුදල් අයකර තිබුණි.

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු රු.18,675,303 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා.

--------------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සබරගමුව පළාත් සභාව මඟින් ලබාදී තිබූ රු.8,922,450 ක් වූ වාහන 09 ක අයිතිය ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2013 හා 2014 වර්ෂ වලදී සභාව වෙත ලද පෙත්සම් මගින් හදුනාගත් අනවසර ඉදිකිරීම් 36 ක් අතුරින් 15 ක් සම්බන්ධව ගනු ලැබූ ක්‍රියා මාර්ග විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර, අනවසර ඉදිකිරීම් 16 ක් සම්බන්ධයෙන් සභාව ලබාදුන් නියෝග ක්‍රියාත්මක කර ඇති බවට පසු විපරම් කර නොතිබුණි.

(ඇ) සභා සේවකයින් 06 දෙනෙකුගේ වැටුප් රහිත නිවාඩු දින සාවද්‍යාව ගණනය කිරීමෙන් සේවකයන්ට වැඩිපුර ගෙවන ලද රු.49,938 ක වැටුප් ආපසු අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඈ) ඝන අපද්‍රව්‍ය ව්‍යාපෘතියක් සඳහා මොරොන්තොට හාල්මැස්ස ලුණුගලවත්ත ඉඩමෙන් අක්කර 10 ක ප්‍රමාණයක් සබරගමු පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතියෙන් රුපියල් ලක්ෂ 40 කට 2014 වර්ෂයේදී මිලට ගෙන තිබුණද , රජයේ තක්සේරුකරුගේ තක්සේරුව රුපියල් ලක්ෂ 30 ක් වූයෙන් , රුපියල් ලක්ෂ 10 ක් වැඩිපුර ගෙවීම්කර තිබුණි.

3.2 ඉඩම් අනුබෙදීම

--------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ගොඩනැගිලි පර්යේෂණ ආයතනය අවස්ථා දෙකකදී අක්කර 08 රූඩ් 01 පර්චස් 8.41 ක් පමණක් අනුමත කර තිබුණද, ප්‍රාදේශීය සභාව මගින් අක්කර 13 රූඩ් 02 පර්චස් 22.67 ක් සඳහා කට්ටි සැළසුම අනුමත කිරීම හේතුවෙන් අක්කර 05 රූඩ් 01 පර්චස් 14.26 ප්‍රමාණයක් වැඩිපුර අනුමත කර තිබුණ අතර එම කට්ටි සැළසුම් අනුමත කිරීමේදී ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මගින් නිකුත් කළ උපදෙස් පත්‍රිකාවේ සඳහන්ව වූ නියමයන් ද ඉටුවන ආකාරයට කටයුතු කර නොතිබුණි.

(ආ) අක්කර 10 පර්චස් 19 කින් යුතු ඉඩමක් විකිණීමට අදාල කට්ටි සැලසුම අනුමත කිරීමේ දී සභාව මගින් 2014 නොවැම්බර් 12 නිකුත් කළ උපදෙස් අතුරින් ප්‍රධාන මාර්ගයේ හා අතුරු මාර්ගවල කාණු පද්ධති හා බෝක්කු අවශ්‍ය තැන්හිදී සභාවේ උපදෙස් පරිදි කොන්ක්‍රීට් කිරීම , සියළුම මාර්ග සඳහා තෙකලා විදුලිය ලබාදීම, සභාවට පවරා ගන්නා ලද බිම් කොටස වටා වැටක් ඉදිකිරීම ආදී කරුණු 2015 ජනවාරි මස විගණන අවස්ථාව වන විටත් ඉටුකර නොතිබුණ ද, ඉඩම් කොටස් වලින් 90% ක් පමණ විකුණා අවසන්ව තිබුණි.

3.3 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

(අ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අවලව පවතින වත්කම් වල අගය රු.504,440 ක් විය.

(ආ) සභාවට අයත් වටිනාකම රු.1,051,050 ක් වූ වත්කම් 03 ක් වසර 03 සිට වසර 08 දක්වා කාලයක් නිශ්ක්‍රීයව පැවතුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

4.1 <u>අයවැය පාලනය</u>

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු අයවැය ලේඛණයෙන් ප්‍රතිපාදනය කර තිබූ වැඩ විෂයන් 14 ක එකතුව රු. 5,438,000 ක ප්‍රතිපාදන 100% ක්ද, වැඩ විෂයයන් 13 ක එකතුව රු.7,135,761 ක ප්‍රතිපාදන වලින් 50% ත් 99% ත් අතර ද වශයෙන් එකතුව රු.12,573,761 ක් සභා කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි.

4.2 <u>නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්</u>

2015 ජුනි 23 දින වන විට විගණන විමසුම් 02 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනු වල වටිනාකම රු. 2,176,330 ක් විය.

5. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) ණයගැති හා ණයහිමි පාලනය